බදුල්ල මහ රෝහලේ රසායනාගාර වෛද්‍යවරයෙකු විසින් පවත්වාගෙන යන පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයකින්, මත්පෙති වර්ග රැසක් පාසැල් සිසුන් ඇතුළු තරුණ පිරිසට අලෙවි කරන බවට තොරතුරු පොලිසිය අනාවරණය කරගෙන ඇති බවට පුවතක්, අරුණ පුවත්පතේ (සැප්.02, 2022) පළ වී තිබිණි. එම පුවත් අන්තර්ගතය තුළ, එම වෛද්‍යවරයා විසින් එම සිසුන්ට අලෙවි කරනු ලැබූ ඖෂධ වර්ග ද නම් සහිතවම සඳහන් වී තිබිණි.

ඔබ සිතන ආකාරයට,

1) මෙසේ මත් වීමට භාවිතා කළ හැකි යැයි කියන ඖෂධ වර්ග වල නම් සඳහන් කිරීම කෙතරම් උචිත වන්නේ ද? එම නම් සඳහන් කිරීම පුවතට අවශ්‍ය වන්නේ ද?

2) එසේ නම් සඳහන් කිරීම, තවත් අයෙකුට වක්‍රාකාර නැඹුරුවක් ඇති කිරීමට හේතු විය හැකිද?
ඔබේ අදහස කුමක්ද?